**දික්වැල්ල ප්‍රාදේශීය සභාව - 2021**
**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

**දික්වැල්ල** ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීම සඳහා දරන ලද රු.4,676,860 ක වියදමක් හා සභාව සතු ළමා උද්‍යානයේ සවි කිරීම සඳහා රු.1,861,920 ක් වැය කර මිලදී ගෙන තිබූ සෙල්ලම් උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදල වෙනුවෙන් ගෙවිය යුතු රු.2,506,148 ක් සඳහා විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් සංශෝධිත මුදල ලැබුණු පසු ගිණුම්ගත කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.468,204ක් ණයහිමියන් යටතේ වැඩිපුර ප්‍රතිපාදන සලස්වා තිබුණි. | ගැලපීම් සටහන් යෙදීමට කටයුතු කරන බව. | |

**1.6.2** **නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එකතුව රු.407,129,532 ක් වූ ගිණුම් විෂයයන් 13 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.286,757,821 ක අසමානතා පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 75,375,089 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු45,159,104 ක් විය.

## 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

### (අ) වරිපනම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් ඒකක සංඛ්‍යාව 4186 ක් වූ අතර වර්ෂය අවසානයට වරිපනම් ඒකක 1269 කින් රු.3,077,680ක හිඟ ශේෂයක් පැවතුණි. | රටේ පවතින තත්ත්වය සමනය වූ වහාම ඉතිරි හිඟ මුදල් ද අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

### (ආ) කඩ කුලී

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව සතු කඩ කාමර 120 ක් බදු දී තිබූ අතර කඩ කාමර 56 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට තිබූ රු.957,133 ක ශේෂයෙන් රු.219,470 ක් 2022 වර්ෂයේ දී අයවී තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.957,135 ක මුදලින් රු.219,470 ක මුදලක් අයකර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන හා සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මත ව්‍යාපෘති යෝජනා 02 ක් යටතේ මහපාදිලියාවත්ත සුසානභූමිය පාර සංවර්ධනය කිරීම සඳහා රු.758,339 ක ගිවිසුම්ගත වටිනාකමට එක්තරා ප්‍රජා සංවර්ධන සමිතියක් වෙත 2020 දෙසැම්බර් 28දින ඉදිකිරීම් කටයුතු පවරා තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ | මල් පැල සිටුවීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන බව. | ඵලදායි ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සුසානභූමියට යන මාර්ගය කොන්ක්‍රීට් අතුරා එම මාර්ගය දෙපස මල්පැල සිටුවීම සඳහා රු.179,513 ක මුදලක් වැය කර දෙපස කොන්ක්‍රීට් බැමි 02 ක් ඉදිකර තිබූ නමුත් 2022 මැයි 25 දින වන විටත් මාර්ගය දෙපස මල් පැල සිටුවීම සිදුකර නොතිබුණි. සුසාන භූමියට පිවිසෙන මාර්ගයේ තවදුරටත් සංවර්ධනය විය යුතු කොටස් තිබිය දී ඒවා සංවර්ධනය කිරීමෙන් තොරව කොන්ක්‍රීට් බැමි ඉදි කිරීම සඳහා රු.179,513 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්ම යටතේ දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රතිපාදන මත දික්වැල්ල බස් නැවතුම්පොළ වහල සහ ඉදිරිපස නවීකරණය කිරීම සඳහා රු.1,857,215 ක ඇස්තමේන්තුවක් සකස් කර එම වටිනාකමට එක්තරා ප්‍රජා සංවර්ධන සමිතියක් වෙත 2021 ජුලි 19 දින පවරා තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාලව සකස් කර තිබූ ගෙවීම් බිල් පත්‍රයෙහි අංක 05 වැඩ විෂය යටතේ මීටර් 105 ක් දිගට වඩිම්බු සකස් කිරීම සඳහා රු.159,600 ක් ගෙවීම් කර තිබුණු නමුත් භෞතිකව ලබාගත් මිනුම් අනුව යොදා තිබූ වඩිම්බුවල දිග මීටර් 31.5 ක් වූ බැවින් මීටර් 73.5 ක් වෙනුවෙන් රු.111,720 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් කර ඇති මුදල රැඳවුම් මුදලින් අඩු කර ඉතිරි වන මුදල අදාල තාක්ෂණ නිලධාරිගේ අධීක්ෂණය යටතේ නිදහස් කිරීමට කටයුතු කරන බව. | නිමි වැඩ ප්‍රමාණයට අනුව ගෙවීම් කළ යුතුය. |